# 10

## නිපුණතා මට්ටම 1.2 : නාට්‍ය කලාව අනෙකුත් කලාවන්ගෙන් වෙනස් වන්නේ කෙසේද

### දෘශ්‍ය කලා

චිත්‍ර, මූර්ති, කැටයම් වැනි දැකීමෙන් පමණක් රස විඳිය හැකි මාධ්‍ය "දෘශ්‍ය කලා"



Lovers of Isurumuniya



### ශ්‍රව්‍ය දෘශ්‍ය කලා

චිත්‍රපට, රූපවාහිනී නාට්‍ය, බැලේ, මුද්‍රා නාට්‍ය, ඔපෙරා, කාටූන් යනාදී කලා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් ලෙස සැලකිය හැක









## නාට්‍ය කලාවේ සුවිශේෂතා

නාට්‍ය කලාවෙහි දකින සජීවී බව, රංග කාලයේ සහ අවකාශ භාවිතයෙහි සීමා සහිත බව, වේදිකාව මත රූපණය කළ හැකි දේ පමණක් තෝරා ගැනීම, චිත්‍ර, සංගීතය, නර්තනය වැනි කලා මාධ්‍යයන් නාට්‍යය හා දායක කර ගැනීම, ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීම, සක්‍රීය ප්‍රේක්ෂක සහභාගිත්වය, නැවත නැවතත් නිර්මාණය වෙනස් කළ හැකිවීම, එක් වේලාවක එක් ස්ථානයක පමණක් ප්‍රදර්ශනය වීම, සෑම දර්ශන වාරයකම නාට්‍ය නිෂ්පාදනයට දායක වූ පිරිස් ප්‍රතිලාභ ලැබීම, ගබඩා කර තබා ගත නොහැකි වීම වැනි කරුණු නිසා නාට්‍ය කලාව මේවා අතර විශේෂත්වයක් ගනී.

## චිත්‍රපටය හා වේදිකා නාට්‍ය අතර සමාන හා අසමාන ලක් ෂණ

| | සිනමාව | වේදිකා නාට්‍යය |
|---|---|---|
| 01 | ධාවන කාලය පැය 1 හෝ 2 කට සීමා වේ. | රංග කාලය පැය 1 හෝ 2 කට සීමා වේ. |
| 02 | චරිත නිරූපණ, සංවාද, ගැටුම් අස්ථා ඇත. | චරිත නිරූපණ, සංවාද, ගැටුම් අස්ථා ඇත |
| 03 | රංග වස්ත්‍රාභරණ, අංගරචනා ආදිය භාවිත වේ. | රංග වස්ත්‍රාභරණ, අංගරචනා ආදිය භාවිත වේ. |
| 04 | තිර පිටපතක් අනුව අධ්‍යක්ෂණය කෙරේ. | නාට්‍ය පිටපතක් අනුව අධ්‍යක්ෂණය කෙරේ. |
| 05 | දෘශ්‍ය ප්‍රයෝග, කැමරා ප්‍රයෝග භාවිත වේ. | වේදිකාව මත ද රූපණ ප්‍රයෝග භාවිත වේ. |
| 06 | සිද්ධි /අවස්ථ හැකිතාක් ඇතුළත් කළ හැකිය. | සිද්ධි/අවස්ථා මෙන් ම චරිත ද සීමිත විය යුතු ය. |
| 07 | සිදුවීම සිදුවන කාලය හා ස්ථාන බහුල ය. | කාලය හා ස්ථාන සීමා සහිත ය. |
| 08 | දර්ශන අවස්ථා ලෙස සංස්කරණය කර ඇත. | නාට්‍යයේ අංක ලෙස ඉදිරිපත් කෙරේ. |
| 09 | පසුතල එළිමහනේ හෝ චිත්‍රාගාරවල නිමැවේ. | වේදිකාවක් මත පසුතල නිර්මාණය කෙරේ. |
| 10 | සිනමා පටය ගබඩාකර තබා ගත හැකිය. | එසේ කළ නොහැක. නාට්‍යයක් සජීවීව සිදුවේ. |